# BLOG කතන්දර

කඩිඩ හොර අයට ශිෂ්‍යත්ව දෙන කතන්දරේ ලියන කොටයි මේ කතාව ක්ලික් වුනේ.

මතක නේද ලංකාවටයි, ඉන්දියාවටයි පොදු ලංකේංඩියා භාෂාව ගැන කතාව. මං පස්සේ ඒකෙ දෙවෙනි කොටසත් ලිව්වනේ මකර ගේ කරදරේ නිසා.

ජාතින් අතර සහයෝගීතාවය වැඩි දියුණු කරන අරමුණෙන් නේ ඔය රුසියාවෙන් ලංකාව වගේ රටවල කොල්ලන්ට, කෙල්ලන්ට එහෙ ගිහිං ඉගෙන ගන්න ශිෂ්‍යත්ව දුන්නේ. එහෙම රුසියාවට ගිය අපේ පොරවල්වලින් සමහරු ඒ සංස්කෘතික එකමුතුකම තවත් වැඩිකරගන්න හිතලා රුසියන් කෙල්ලන්ව කසාදත් බැන්දා. සමහරු එහෙම නතරවුණා. සමහරු ලංකාවට ආව. හුග දෙනෙක් හැබැයි දැන් ඉන්නේ එංගලන්තය, ඕස්ට්‍රේලියාව වගේ තුන්වෙනි රටවල්වල.

ඉතිං අපේ පොරක් තමන් ගේ රුසියානු බිරින්දෑ, ශාෂා ත් එක්ක ලංකාවට ඇවිත් ජීවත්වෙන්න පටන් ගත්තා. දෙන්නම කොළඹ පැත්තේ රැකියාව කලේ.

සාමාන්‍යයෙන් සුද්දෝ කියන්නේ එංගලන්තේ, ඉංගිරිසි ජාතිකයින්ට නේ. නමුත් ඉතිං, හම සුදු නං අපිට කවුරුත් සුද්දෝ. ලේබල් ගහල තියෙනවැයි?

ඉතිං අපේ මේ රුසියන් සුද්දි ශාෂා ට ටිකක් සිංහල තේරෙනවා. ශාෂා බස් එකේ වැඩට යනකොට අපේ සමහර සිංහල පොරවල් කියනවාලු, අනේ මේ සුද්දියොත් එනවනේ හිරවෙලා බස්වල යන්න, කාර් එකක් අරං යන්නේ නැතුව කියලා.

ඉතිං අපිට සුද්දි වුනාට ශාෂා ගේ මව් බස රුසියන් නේ. එයාට ඕනැ වුණා තමන් දන්න ඉංගිරිසිය ටිකක් දියුණු කර ගන්න.

මගේ තව යාළුවෙකු ගේ තාත්තා හොඳ උගත් කඩු කාරයා. ඒ අංකල් ගාවට තමයි ශාෂා යන්න පටන් ගත්තේ ඉංගිරිසි දියුණුකර ගන්න. දවසක් දෙකක් ශාෂා අංකල්ලා ගේ ගෙදරට එනව දැකපු පාර අයිනේ කඩේ මුදලාලි ඔන්න අංකල්ගෙන් මෙහෙම අහනවා.

මහත්තයා මං දැක්කා සුද්දියෙක් එනවා දවස් දෙක තුනක් මේ ගෙදර පැත්තේ. ඒ කවුද මහත්තයා.

ආ, ඒ අර අපේ පුතාගේ යාළුවෙකු ගේ නෝනා, පිටරට ඉගෙන ගන්න ගිහින් ඉඳලා එනකොට බැඳලා ආවේ, මේ ලගදී.

ඉතිං මහත්තයා මෙහේ නිතරම එන්නේ ඒ සුද්දී?

ආ, ඒ මේ මගෙන් ඉංගිරිසි ඉගෙන ගන්න.

අනේ මේ, මහත්තයා මට විහිළු නොකර ඉන්න. සුද්දියො එයිද මේ මහත්තයගෙන් ඉංගිරිසි ඉගෙන ගන්න?

**කතන්දරකාරයා** http://kathandara.blogspot.com

3 වන පිටෙන්

අසාංජ් සිය ආත්ම අභිලාෂය සේ දැවැන්ත පද්ධති නිර්මාණය කිරීම ගැන කතා කරන්නේ නිකමට නොවන බව මෙම සංඛ්‍යා මොනවට පැහැදිලි කරයි. බලවත් රාජ්‍ය විසින් පන්න පන්නා පහර දීමට බලා සිටින නමුත් පසුගිය සතිය වන විට ඇමෙරිකානු ටයිම්ස් සඟරාවේ ල2010 වර්ෂයේ මිනිසාල ලෙස පාඨක ඡන්ද 21,736ක් ලබා ගනිමින් පෙරමුණට පැමිණ සිටියේ ය.

ඔහු විසින් නිර්මාණය කර ඇති විකි ලීක්ස් නම් වෙබ් අඩවිය ද ඒ හා සමඟ බැඳුණු ස්වේච්ඡා ක්‍රියාකාරීන්ගේ ජාලය ද අපේ යුගය සඳහා අන්තර් ජාලය මත පදනම් වූ නව ජනමාධ්‍ය භාවිතයක් හඳුන්වා දෙයි. වෙබ් අඩවිය සතු සංකීර්ණ ජාලය පවත්වා ගන්නේ සිය ගණනාවක් වූ මෙම ස්වේච්ඡා තොරතුරුකරුවන් විසිනි. පූර්ණ කාලීනව වැඩ කරන තුන් හතර දෙනෙකු හැරුණ විට අන් සියල්ලෝ සිය කාලයෙන් යම් ප්‍රමාණයක් විකි ලීක්ස් වෙනුවෙන් වැය කරති. ප්‍රධාන පුද්ගලයින් හැඳින්වෙන්නේ මුලකුරකින් පමණ ය. සියළු විද්‍යුත් පණිවිඩ හුවමාරු කැරෙන්නේ රහසිගත සංඥාවන්ට පෙරළෙන පරිදි ය. ඒ බලවත් ආණ්ඩු සිය ජාලය තුළට රිංගනු වැළැක්වීමට ය.

කිසිදු අයෙකුට වාරණය කළ නොහැකි පරිදි පවත්වාගෙන යන විකි ලීක්ස් තොරතුරු අඩවිය සිය ගණනාවක් ලියා පදිංචි නම්වලින් විවිධ අන්තර්ජාල පදනම් මත ඉතා සංකීර්ණ ජාලයක් ගොඩ නගා තිබේ. මෙයට අමතරව විකි ලීක්ස් තොරතුරු අඩවියේ හිතවතුන් ද ජායාමය අඩවි ගණනාවක් වෙන වෙනම පවත්වාගෙන යයි. අසාංජ් කියන්නේ සිය තොරතුරු අඩවිය බිඳ හෙළිය නොහැකි එකක් බවයි.

විය යුතු පරිදිම අසාංජ්ට එරෙහිව පුද්ගලික ප්‍රහාරයන් ගණනාවක් ද දියත්ව තිබේ. ඉන් එකකින් කියැවෙන්නේ ඔහු ස්ත්‍රී දූෂකයකු බවයි. තවත් චෝදනාවක් වන්නේ ඔහු අධිපතිවාදී ලෙස කටයුතු කරන බව යි. චෝදනා සත්‍ය වුවත් නැතත් ඒ මගින් සෝදා හැරිය නොහැකි පරිදි අසාංජ් සිය පා සළකුණු නිහඬව නොසිටින යහපත් මිනිසුන්ගේ ගමන් මාර්ගයේ ප්‍රබල ලෙස සටහන් කර අවසන් ය. යුද්ධය විසින් මිනිස්කමට එරෙහි බරපතලම අපරාධය බව විකි ලීක්ස් තොරතුරු අඩවිය යළිත් වතාවක් සනාථ කරයි. යුද්ධයේ හිමිකරුවන් වන කිසිවකු ඊට කැමැති නැත.

ජුලියන් අසාංජ් අපේ කාලයේ වීරයකු වන්නේ අපේ කාලයේ ඇති කාළකණ්නි අකර්මණ්‍ය බවට ඔහු ඉදිරිපත් කරන අභියෝගය නිසා ය. ඔහුගේ දැවැන්ත හෙළිදරව් කිරීම් විසින් කලකට පෙර නම් මහජන මතයේ දැවැන්ත වෙනස්කම් සිදුවන්නට ඉඩ තිබුණි. අද එවැනි ඉදිරිගාමී මහජන මනෝභාවයක් ඇත්තේ කලාතුරකින් විශේෂ තත්ත්වයන් යටතේ පමණය. අසාංජ් ඇත්ත වශයෙන්ම නම් අඳුරු අහසක රිදී වලාවක් වැන්න. වෙලාවක් ඇතොත් යඑඑචඨරුරුඅසනසකැනිගදරටරු අඩවියට ගොඩ වී යුක්තිය වෙනුවෙන් කෙරෙන සැබෑ ජනමාධ්‍ය කෙළසකදැයි දැක බලා ගන්න.


# Experienced Teacher

offers science tuition
for year 7 to year 10.

Contact :

**Sriya on 0413 444 908**


## Can You Help This Distillate Family ?



Can you help a family who lived as a street children near a religious Devol at Chilaw.

If you spend at least \$10 out of the money you have spent during this festival season for smoking and alcohol.
You can save this family.

| | | | |
|---|---|---|---|
| 01. | Mother | : | Rajagalgoda Lokuge Ramya |
| 02. | 1. Daughter | : | B. D. Nadeesha Madhubashini |
| | 2. Daughter | : | B. D. Dilsha Shashikala |
| | 3. Daughter | : | B. D. Disna Sanjeewani |

Contact No. : 0094 77 1746394

Ven. Kimbulapitiya Dhammarathana Thero
Sri Sudharshanarama Temple
Madampe, Sri Lanka.
Tel. 0094 32 2247527

Mr. Basil Fernando
(Retired Principal)
"Achani", Weerahena,
Marawila, Sri Lanka.
Tel. 0094 32 2254489

| | | |
|---|---|---|
| *Bank Details :* | | Rajagalgoda Lokuge Ramya |
| Bank | : | Peoples Bank - Nattandiya Sri Lanka |
| Acc. No. | : | 083 - 2 - 001 - 8 - 7280718 |

**මේ අසරණ පවුලට පිහිට විය හැකිද ?**

හලාවත ප්‍රදේශයේ ප්‍රසිද්ධ දෙවොලක් අසල වීදි දරුවන්සේ ජීවත් වූ මෙම පවුලට ඔබටත් උපකාර කල හැකිද? මේ උත්සව සමයේ ඔබ විසින් මතට දුමට වැය කරණ අසීමිත මුදලින් ඩොලර් 10 ක් වැය කලොත් ඔවුන් මේ දුකින් මුදවා ගත හැක.

Recommended. ඔබට කලහැකි සුදුසු අයුරකින් උදව් කරන්න.

Coroner (Hospital Marawila)
Justice of Peace (All Island)
DESHA KEERTHI
RANDENI ARACHCHIGE DON LESLI
'RANMAHAL', WEERAHENA, MARAWILA


